| නිකුත් කළේ | පාලක මණ්ඩලයේ ලේකම් |
|---|---|
| දිනය | 2023.11.17 |

## ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සංයුතිය

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත ප්‍රකාර ව, ශ්‍රී ලංකා මහ බැංකුවේ පරිපාලනමය සහ කළමනාකරණ කටයුතු පාලනය කිරීමට සහ මහ බැංකුවේ පොදු ප්‍රතිපත්ති තීරණය කිරීම සඳහා වගකිව යුතු ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකු පාලක මණ්ඩලය පිහිටුවා ඇත.මෙම නීතියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මින් පෙර පැවති මුදල් මණ්ඩලයේ පත්කළ සාමාජිකයන් මහ බැංකුවේ පාලක මණ්ඩල සාමාජිකයන් ලෙස අඛණ්ඩ ව කටයුතු කරයි.

ඒ අනුව,2021.06.29 දින සහ 2022.07.27 දින සිට ක්‍රියාත්මක වන පරිදි මුදල් මණ්ඩලයේ පත්කළ සාමාජිකයන් වූ, පිළිවෙලින් ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා සහ ඒ. එන් ෆොන්සේකා මහතා තවදුරටත් පාලක මණ්ඩලයේ සමාජිකයන් වූහ. කෙසේ වෙතත්, 2020.07.29 දින සිට මුදල් මණ්ඩලයේ සාමාජිකාවක වූ ආචාර්ය රානි ජයමහ 2023.09.12 සිට ක්‍රියාත්මක වන පරිදි ඇයගේ ඉල්ලා අස්වීම භාර දුන් බැවින් තවදුරටත් ඇය පාලක මණ්ඩලයේ සාමාජිකාවක නොවිණි. පාලක මණ්ඩලයේ පත්කළ සාමාජිකයෙකු ලෙස අඛණ්ඩ ව කටයුතු කළ ජනාධිපති නීතිඥ, සංජීව ජයවර්ධන මහතා 2023.11.05 සිට ක්‍රියාත්මක වන පරිදි ඔහුගේ ඉල්ලා අස්වීම භාර දුණි. ඒ අනුව, ආර්ථික අර්බුදය සම්බන්ධයෙන් ගොනු කළ මූලික අයිතිවාසිකම් නඩුවට අදාළ ව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එහි අවසන් නඩු තීන්දුව 2023.11.14 දින ලබා දීමට පෙර ආචාර්ය ජයමහ මිය සහ සංජීව ජයවර්ධන මහතා යන දෙපළ සිය ඉල්ලා අස්වීමේ ලිපි යොමු කළහ.

***පාලක මණ්ඩලය***

ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් පාලක මණ්ඩලයෙහි සභාපති ලෙස මහ බැංකු අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ කටයුතු කරන අතර ආචාර්ය රවී රත්නායක (2023.09.21 දින පත්කළ), අනුෂ්ක එස්. විජේසිංහ (2023.09.21 දින පත්කළ) සහ විශ් ගෝවින්දසාමි (2023.10.26 දින පත්කළ) යන මහත්වරුන් එහි අලුතින් පත් කළ සෙසු සාමාජිකයන් වේ.

අලුතින් පත්කළ සාමාජිකයන්ගේ විස්තර පහත පරිදි ය:

**ආචාර්ය රවී රත්නායක**



ආචාර්ය රවී රත්නායක එක්සත් ජාතීන්ගේ ආසියානු සහ ශාන්තිකර කලාපය සඳහා වන ආර්ථික සහ සාමාජීය කොමිෂන් සභාවේ (ESCAP) අර්ථශාස්ත්‍රඥයෙකු මෙන් ම, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වෙළෙඳ සහ ආයෝජන කටයුතු පිළිබඳ හිටපු අධ්‍යක්ෂවරයෙකු ද විය. ආචාර්ය රත්නායක එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වෙළෙඳාම පිළිබඳ ආසියානු ශාන්තිකර පර්යේෂණ සහ පුහුණුකරණ ජාලය (ARTNeT), ආසියානු ශාන්තිකර ව්‍යාපාර සංසදය (APBF), ආසියානු-ශාන්තිකර තිරසර සංවර්ධන ජාලය, නිර්ලේඛන වෙළෙඳාමේ විශේෂඥයන් පිළිබඳ ආසියානු - ශාන්තිකර විශේෂඥ ජාලය (UN NExT) ඇතුළුව කලාපීය සහයෝගිතා යාන්ත්‍රණ ගණනාවක් දියත් කර ඇති අතර,ආසියානු ශාන්තිකර වෙළෙඳාම සහ එකඟතාව (APTA) යළි නඟාසිටුවීමට සාමාජික රටවලට සහාය ලබා දුණි. ඒ මහතා සහශ්‍ර සංවර්ධන ඉලක්ක, ආයතනික සමාජීය වගකීම (CSR), තිරසර සංවර්ධනය, වෙළෙඳාම,ආයෝජනය සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SMEs) සම්බන්ධයෙන් ප්‍රචලිත ප්‍රකාශන සහ ව්‍යාපෘති ගණනාවක් සම්බන්ධීකරණය සහ අධීක්ෂණය සිදු කළේය. ආචාර්ය රත්නායක ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, එක්සත් ජාතීන්ගේ සංවිධානය, ජාත්‍යන්තර සංවර්ධනය සහ කෘෂිකර්ම සංවිධානය සඳහා වන එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතනයන්හි ද

උපදේශකවරයෙකු ලෙස කටයුතු කර ඇත. තවද, ඔහු 2016 සිට 2018 දක්වා ශ්‍රී ලංකාව ඇතුළුව සංවර්ධනය වෙමින් පවතින රටවල් ගණනාවක උපදේශකවරයෙකු ලෙස කටයුතු කර ඇත. ජාතීන් අතර විෂමතා අවම කිරීමේ අරමුණින් පිහිටුවා ඇති Bridging the Gap පදනමෙහි (BGF) මහ ලේකම් ලෙස ඒ මහතා අධ්‍යාපනය, හරිත සංවර්ධනය සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර යන ක්ෂේත්‍රයන්හි ආයතනික සමාජීය වගකීම් ව්‍යාපෘති ගණනාවක් දියුණු කළේය.

එක්සත් ජාතීන්ගේ සංවිධානයට එක් වීමට ප්‍රථම, 1980 මුල් භාගයේ දී, ආචාර්ය රත්නායක ශ්‍රී ලංකා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ සේවය කළ අතර, තීරුබදු සහ වෙළෙඳාම පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ පර්යේෂණ අධ්‍යක්ෂ ලෙස ද කටයුතු කළේය. ඔහු 1991 සිට 1999 දක්වා කාලයේ දී නවසීලන්තයේ ඕක්ලන්ඩ් විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කළේය. ඔහු සංවර්ධනය සහ ජාත්‍යන්තර ආර්ථික විද්‍යාව ආශ්‍රිත ගැටලු පිළිබඳ ඉගැන්වීමේ හා පර්යේෂණය කිරීමේ දී ප්‍රායෝගික හා ශාස්ත්‍රීය යන දෙඅංශයෙන් ම වසර 40කට අධික අත්දැකීම් සතු අර්ථශාස්ත්‍රඥයෙකු වන අතර, නිර්දේශිත සඟරා ලිපි, ග්‍රන්ථ හා පර්යේෂණ පත්‍රිකා ගණනාවක් ප්‍රකාශයට පත්කිරීම මෙන්ම සුවිශාල ප්‍රකාශන සංඛ්‍යාවක් අධීක්ෂණය සහ සකස් කිරීම ද සිදු කර ඇත.

**අනුෂ්ක එස්. විජේසිංහ මහතා**



අනුෂ්ක එස්. විජේසිංහ මහතා රාජ්‍ය,පෞද්ගලික අංශ සහ අදාළ ක්ෂේත්‍රයන්හි උපදේශන මට්ටමේ අත්දැකීම් සහිත අර්ථශාස්ත්‍රඥයෙකි. ඔහු සුහුරු අනාගතයක් සඳහා වන කේන්ද්‍රයේ රාජ්‍ය ප්‍රතිපත්තිමය චින්තනයේ සම නිර්මාතෘ/ අධ්‍යක්ෂවරයා වේ. විජේසිංහ මහතා මොන්ගෝලියාව, පාකිස්ථානය, මියැන්මාරය, මාලදිවයින සහ ඉරානය යන රටවල උපදේශන සඳහා ජාත්‍යන්තර උපදේශකයෙකු ලෙස කටයුතු කර ඇත. මෙම තනතුර සඳහා පත්වන තෙක් ඒ මහතා සෙලාන් බැන්ක් පීඑල්සී සහ හැටන් නැෂනල් බැන්ක් ෆිනෑන්ස් පීඑල්සී යන ආයතනවල ජ්‍යෙෂ්ඨ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කළේය. ඔහු තවදුරටත් සී/ස ෆෙයාර්ෆස්ට් රක්ෂණ සමාගමේ සහ ගුඩ් ලයිෆ් එක්ස් (පුද්) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ද කටයුතු කරයි. තවද, විජේසිංහ මහතා ජාත්‍යන්තර නවෝත්පාදන නියෝජිත ආයතන සභාව, අපනයන සංවර්ධනමණ්ඩලය සහ අපනයන පිළිබඳ අධීක්ෂණ කමිටුව සහ ජනාධිපති ලේකම් කාර්යාලයේ සෘජු විදේශීය ආයෝජන පිළිබඳ අධීක්ෂණ කාරක සභාවේ ද සේවය කරයි. මීට පෙර ඔහු ලංකා වාණිජ මණ්ඩලයේ ප්‍රධාන අර්ථශාස්ත්‍රඥ, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ අර්ථශාස්ත්‍රඥ සහ සංවර්ධන ක්‍රමෝපායන් සහ ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු පිළිබඳ අමාත්‍යවරයාගේ උපදේශක යනාදී තනතුරු දැරී ය. විජේසිංහ මහතා ලෝක ආර්ථික සංසදයේ නව්‍යකරණ පාරිසරික පද්ධති පිළිබඳ ගෝලීය අනාගත සභාවේ සාමාජිකයෙකු මෙන්ම සියෝල්හි කොරියානු සංවර්ධන ආයතනයේ ආසියානු පදනම් සංවර්ධනයේ අධිසාමාජිකයෙකු විය. ලීඩ්ස් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලන්ඩන් යුනිවර්සිටි කොලේජ් වෙතින් ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ද ලබාගෙන ඇති විජේසිංහ මහතා හාවර්ඩ් කෙනෙඩි පාසලේ ‘ප්‍රමුඛ ආර්ථික වර්ධනය’ පිළිබඳ විධායක වැඩසටහනෙහි උපාධිධරයෙකු ද වේ.

**විශ් ගෝවින්දසාමි මහතා**



විශ් ගෝවින්දසාමි මහතා ඇමෙරිකානු එක්සත් ජනපදයේ හාර්ට්ෆෝර්ඩ් විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධරයකු වන අතර විද්‍යාවේදී (විද්‍යුත් ඉන්ජිනේරු) උපාධිධරයකු ද වේ. ඔහු වර්තමානයේ විවිධාංගීකරණය වූ සමූහ ව්‍යාපාරයක් වන ශ්‍රී ලංකාවේ හොඳම ලැයිස්තුගත සමාගම් 50 අතරින් එකක් වන සන්ශයින් හෝල්ඩින්ග්ස් පොදු සමාගමේ සමූහ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරයි. ඔහු ශ්‍රී ලංකා සහතිකලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකු වන අතර, ලංකා වාණිජ මණ්ඩලයේ සහ ලංකා සේවායෝජක සන්ධානයේ හිටපු සභාපතිවරයා වේ.

ඔහු සන්ශයින් හෝල්ඩින්ග් සමාගමේ වත්මන් ධුරයේ කටයුතු කිරීමට පෙර, ටාටා ඉන්දියා සමඟ හවුල්කාරීත්වයෙන් යුත් විවිධාංගීකරණය කළ වැවිලි කළමනාකරණ සමාගමක් වන වටවල වැවිලි සමාගමේ

ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් සේවය කළේය. රජයට හිමි වැවිලි සමාගමක් වූ වටවල සමාගම පෞද්ගලීකරණයෙන් අනතුරුව කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ලැයිස්තුගත සමාගම් අතර ඉහළම ප්‍රාග්ධනීත ප්‍රාදේශීය වැවිලි සමාගම දක්වා සාර්ථක ව පරිවර්තනය කිරීමෙහි දී සාධනීය කාර්යභාරයක් ඉටු කිරීම සම්බන්ධයෙන් ඒ මහතා මහත් පැසසුමට ලක්විය. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළෙහි තේ සන්නාමයන් වන සෙස්ටා, වටවල සහ රන්කහට වැනි සන්නාම බිහි කිරීමේ ගෞරවය ද ඔහුට හිමි විය. ඉන්දියාවේ ටාටා සමාගම ශ්‍රී ලංකාවේ ඔවුන්ගේ ආයතන කිහිපයක ම අධ්‍යක්ෂ මණ්ඩල කිහිපයකට ම ගෝවින්දසාමි මහතා පත් කර ඇත.

***මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය***

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සහ දේශීය මිල ස්ථායීතාව සාක්ෂාත් කර ගැනීම සහ පවත්වා ගෙන යෑම සඳහා නම්‍යශීලී උද්ධමනය ඉලක්කගත කිරීමේ රාමුව හා අනුකූල ව නම්‍යශීලී විනිමය අනුපාතික පාලනයක් ක්‍රියාත්මක කිරීම සඳහා පැවරී තිබෙන මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයක් තිබිය යුතුවේ.

ඒ අනුව,ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතිය සහිතව ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව, 2023.09.21 දින සිට ක්‍රියාත්මක වන පරිදි, අතිගරු ජනාධිපතිතුමන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් ආචාර්ය දුෂ්නි වීරකෝන් මෙනෙවිය සහ ආචාර්ය ප්‍රියංග දුනුසිංහ පත්කර ඇත.

ඉහත සාමාජිකයන් දෙදෙනා පාලක මණ්ඩලයේ සාමාජිකයන් සහ මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව භාර නියෝජ්‍ය අධිපතිවරුන් සමඟ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වෙත එක්වන තාක්ෂණික විශේෂඥයන් වේ.

මෙම තාක්ෂණික විශේෂඥයන් දෙදෙනාගේ විස්තර පහත පරිදි ය:

**ආචාර්ය දුෂ්නි වීරකෝන් මෙනෙවිය**



සිය ආචාර්ය උපාධිය ලබා ගැනීමෙන් පසු, 1994 දී ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය හා සම්බන්ධ වී දැනට එහි විධායක අධ්‍යක්ෂවරියක සහ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ අංශ ප්‍රධානී ලෙස කටයුතු කරන ආචාර්ය දුෂ්නි වීරකෝන් මෙනෙවිය සාර්ව ආර්ථික ප්‍රතිපත්ති, කලාපීය වෙළෙඳ ඒකාබද්ධතාව සහ ජාත්‍යන්තර ආර්ථිකය පිළිබඳ ලිපි රැසක් ලියා පළ කොට ඇත.ඇය වර්තමානයේ දී ස්ප්‍රින්ගර් ප්‍රකාශන ආයතනයේ දකුණු ආසියානු ආර්ථික හා ප්‍රතිපත්ති අධ්‍යයන වාර ප්‍රකාශනවල සංස්කාරකවරියක ලෙස ද දකුණු ආසියානු ආර්ථික ජර්නලයේ ප්‍රධාන සංස්කාරක ලෙස ද දකුණු ආසියානු සංවර්ධන ජර්නලයේ සහ වයිලි ජාත්‍යන්තර සංවර්ධන ජර්නලයේ සංස්කාරක මණ්ඩලයේ සාමාජිකාවක ලෙස ද ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වාර්ෂික මුඛ්‍ය වාර්තාව වන "ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය" ප්‍රකාශනයේ සංස්කාරක ලෙස ද කටයුතු කරන්නීය.

මින් පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයෙහි (2019-2020) පත් කළ සාමාජිකාවක ලෙස සේවය කළ ඇය ආර්ථික ස්ථායීකරණ, ප්‍රතිසාධනය සහ ප්‍රවර්ධනය පිළිබඳ කමිටුවෙහි සාමාජිකාවක සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි අධ්‍යක්ෂිකාවක ලෙස ද සංස්ථාපිත ආයතනික මණ්ඩලයන්හි ශ්‍රී ලංකා රජයෙහි ප්‍රතිපත්ති සංවර්ධන කමිටු සමඟ කටයුතු කිරීමෙන් පෘථුල අත්දැකීම් ලබා ඇත. ඇය නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ (2007-2016) සහ කාගිල්ස් බැංකුවේ (2018-2019) විධායක නොවන අධ්‍යක්ෂවරියක වශයෙන් ද කටයුතු කර ඇති අතර කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජ ප්‍රතිපත්ති විශ්ලේෂණ සහ පර්යේෂණ කේන්ද්‍රයෙහි අධ්‍යක්ෂවරියක සහ ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් සරසවියේ සංවර්ධන ආර්ථික විද්‍යාව සහ තිරසරබව සඳහා වන උපදේශන මණ්ඩලය ඇතුළු අධ්‍යාපනික ආයතනවල අධ්‍යක්ෂ තනතුරු ද දරා ඇත. ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව සහ ලෝක වෙළෙඳ සංවිධානය වැනි ජාත්‍යන්තර සංවිධාන වෙත උපදේශිකාවක ලෙස ද ඇය කටයුතු කර ඇත.

එක්සත් රාජධානියේ බෙල්ෆාස්ට්හි ක්වීන්ස් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව සඳහා විද්‍යාවේදී ප්‍රථම පන්තියේ ගෞරව උපාධියක් හිමි දුෂ්නි වීරකෝන් මෙනෙවිය එක්සත් රාජධානියේ මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය සහ ආචාර්ය උපාධිය ලබාගත්තා ය. කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ ශිෂ්‍යත්වය ද ක්වීන්ස් විශ්වවිද්‍යාලයේ මැකේන් පදක්කම සහ ශිෂ්‍යත්වය ද මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි

ශිෂ්‍යත්වය ද එක්සත් රාජධානි රජයෙන් පිරිනැමෙන ජාත්‍යන්තර පර්යේෂණ ශිෂ්‍යත්වය ද මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයෙන් ඩ්‍රමන්ඩ් ෆ්‍රේසර් පර්යේෂණ ශිෂ්‍යත්වය ද වීරකෝන් මෙනෙවිය විසින් දිනාගෙන ඇත.

**ආචාර්ය ප්‍රියංග දූනුසිංහ**



කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ මහාචාර්යවරයෙකු වන ආචාර්ය ප්‍රියංග දූනුසිංහ එම විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු ප්‍රධානී ලෙස ද කටයුතු කරයි. ආර්ථිකමිතිය, සංඛ්‍යානය, ප්‍රමාණාත්මක ශිල්පක්‍රම, මූල්‍ය ආයතන, සංවර්ධන ආර්ථික විද්‍යාව, ජාත්‍යන්තර වෙළෙඳාම හා මූල්‍යය යන විෂයයන්හි ඉගැන්වීම්, පර්යේෂණ, පුහුණු කිරීම් සහ උපදේශක සේවා සැපයීමේ වසර 20ක පමණ අත්දැකීම් සහිත ඔහුගේ පර්යේෂණ ක්ෂේත්‍ර වන්නේ කෘෂිකර්මය, මූල්‍ය වෙළෙඳපොළ, දරිද්‍රතාව, ශ්‍රමය, රාජ්‍ය ණය, අධ්‍යාපනය සහ ජාත්‍යන්තර වෙළෙඳාම හා ආයෝජනය යි. ආචාර්ය දූනුසිංහ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය, ලෝක බැංකුව, යුරෝපීය සංගමය, ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර කම්කරු සංවිධානය, වෙළෙඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව, ශ්‍රී ලංකා රජයේ මුදල් අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය, කම්කරු අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය යන ආයතනවල උපදේශකයෙකු වශයෙන් ද සේවය කර ඇත. ඒ මහතා ප්‍රකට විවිධ සඟරාවන්හි පර්යේෂණ ලිපි කිහිපයක් පළ කර ඇති අතර, පර්යේෂණ සම්මාන ගණනාවක් දිනා ඇත. එමෙන්ම, ඔහු මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය යන දෙඅංශයෙහි ම නිත්‍ය සම්පත් දායකයෙකි.